**රණවිරු සේවා අධිකාරිය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රණවිරු සේවා අධිකාරියේ 20201දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රණවිරු සේවා අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය රණවිරු සේවා අධිකාරියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් රණවිරු සේවා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ රණවිරු සේවා අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, රණවිරු සේවා අධිකාරියේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධෙයන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය සතුව තිබෙන ගෘහ භාණ්ඩ හා උපකරණ අයිතම 414 ක් සහ විදුලි උපකරණ අයිතම 351 ක් ප්‍රවර්තන වර්ෂය තුල ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර රාජ්‍ය අංශයේ ගිනුම්කරණ ප්‍රමිත අංක 07 හි 90 වන වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශන තුල අදාල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සීමිත කාර්ය මණ්ඩලයක් චක්‍රිය පදනමින් සේවයට කැඳවීම සහ නිවසේ සිට රාජකාරි සිදු කිරීමත්, නිසා අධිකාරියේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අදාළ සුදුසු කමිටුවක් පත්කර ගැනිමට ප්‍රමාද විම හේතුවෙන් වර්ෂය ආරම්භයේ දී වත්කම් ප්‍රත්‍යගණනය සිදු කිරීමට හැකි නොවූ අතර, එය 2021.12.31 දින සිදු කර ගිණුම් ගත කරන ලදි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල නිශ්චිතව දක්වා ඇති උපදෙස් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියල කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) යුද්ධ හමුදා පුනුරුත්ථාපන මධ්‍යස්ථානය වෙතින් රු.10,484,441ක් වටිනා උපකරණ මිලදී ගැනීමට ඇනවුම් කර තිබුණද ඒ සදහා ගෙවිය යුතු මුදල් ලෙස රු.8,200,000 ක් ලෙස ගිණුම්වල ඇතුලත් කර තිබුණි. ඒ අනුව ආබාධිත උපකරණ වියදම රු.2,284,441 කින් අවප්‍රමාණය වී තිබුණි. | මෙම අඩුපාඩුව 2022 වර්ෂයේ ගිණුම් තුළ නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගණුදෙනු හා සිද්ධීන්ගේ යථා ස්වරූපය මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි ගිණුම්ගත කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රවර්තන වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම රු.1,128,206 ක් වුවත් මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශයේ රු.945,083ක ලෙස දක්වා තිබුණි.ඒ අනුව වර්ෂයේ වියදම් රු.183,123 කින් අඩුවෙන් දක්වා ඇත. | ප්‍රවර්තන වර්ෂයේදී සේවයෙන් ඉවත් වු නිලධාරියාගෙන් අධිකාරියට අයවිය යුතු රු. 183,123.00 ක් වු වැටුප් මුදල, ඔහුට හිමි පාරිතෝෂික දීමනාවෙන් අවකරණය කිරීමෙන් පසු ඉතිරි මුදල ගෙවන ලදි. මෙසේ අවකරණය කරන ලද වැටුප් මුදල, වැටුප් සහ වේතන ගිණුමට බැර කිරීම වෙනුවට පාරිතෝෂික දීමනා වියදම් ගිණුමට බැර කිරීම නිසා මෙම අඩුපාඩුව සිදුවී ඇත. | කාලපරිච්ඡේදයට අදාල ගනුදෙනු සියල්ල නිවැරදි මූල්‍ය ප්‍රකාශන වල නිරූපනය කල යුතුය. |
| (ඇ) 2020 වර්ෂයට අදාල මාපිය රැකවරණ දීමනා රු.3,108,000 ක් 2021 වර්ෂයේ වියදම තුල අන්තර්ගත වන බැවින් ප්‍රවර්තන වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා ඇත. | 2020 වර්ෂයේ හිග මුදල පෙර වර්ෂයේ ගැලපීම් ගිණුමට හර කිරීම වෙනුවට 2021 වර්ෂයේ මාපිය රැකවරණ දීමනා ගිණුමට හර කිරීම නිසා මෙම අඩුපාඩුව සිදුවී ඇත. 2022 වර්ෂයේ සිට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදුකරන බව දන්වා ඇත | සමාලෝචිත වර්ෂය තුල සිදුවූ ගනුදෙනු හා සිද්ධීන් සියල්ල මූල්‍ය ප්‍රකාශන වල නිරූපනය කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රණවිරු සේවා අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකු වෙත 2014 වර්ෂයේදී ලබාදී තිබුණු රු.1,830,450 ක අත්තිකාරම් මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | පලමු විනය පරීක්ෂණයෙන් චූදිතයන් නිදහස් කර ඇති බැවින් ඒක පුද්ගල විනිශ්චය සභාවේ තීරණය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බැවින්ද අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි 2022.2.18 සිට නැවත විනය පරීක්ෂණයක් ආරම්භකර ඇති අතර එහි විමර්ෂණ මේ වන විටත් සිදුකරමින් පවතී. | අධිකාරිය වෙත අයවීමට ඇති මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මස දක්වා මාස 18 ක කාලය තුල ගිණුම් හිමියන් දෙදෙනෙකු වෙත අවිධිමත් ලෙස රු.5,940,500 ක මුදලක් ගෙවා තිබුණි. මෙම මුදලින් | මෙම අක්‍රමිකතාවය සඳහා සිවිල් පුරවැසියෙකු හා රණවිරු සේවා අධිකාරියේ රාජකාරි කටයුතු සිදුකල නිලධාරින් 15 දෙනෙකු ඇතුලු 16 දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. මොවුන්ගෙන් 6 දෙනෙක් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත | අධිකාරිය වෙත අයවීමට ඇති මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| රු.4,978,580 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | කල අය අතර ඔවුන් හා සිවිල් පුරවැසියන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයට අනුව නීත්‍යානුකූලව කටයුතු කල නොහැක. අනෙක් නිලධාරීන් 9 දෙනොගෙන් 7 දෙනෙක් සේවයෙන් ඉවත් වී ඇත. 2 දෙනෙකු පමණක් දැනට සේවයේ නිරත වේ. එම දෙදෙනා හැරුණු විට අනෙකුත් නිලධාරීන් සඳහා කටයුතු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කොටුව මහේස්‍රාත් අධිකරණයේ අංකබී/11041/2018 යටතේ පැමිණිල්ලක් ගොනුකර අදාල විමර්ෂණය සිදුකරනු ලබන බව දන්වා ඇත. | |

## 1.7 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීතිරීති රෙගුලාසි ආදියට යොමුව | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොමැති බව පිළිගනිමි. 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර ඇති බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|
| විරු සහන නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා (ආපසු ගෙවීමේ පදනම මත) රු.281,300,000 ක මුදලක් සහ වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.12,000,000 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රවර්තන වර්ෂය තුල අධිකාරිය වෙත ලැබී තිබුණ අතර එම අගයන් දෙක එකතුකර ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | වත්කම් අත්පත් කරගැනීම සඳහා රු.12,000,000.00ක් මුදලක් ද රණවිරුවන් වෙත ණය ලබා දීම සඳහා රු. 281,300,000.00ක මුදලක් ද ලබා දෙන ලද අතර එම සියළු මුදල් රජයේ දායක ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම් සිදුකරන ලදී. ඒ අනුව රජයේ දායක ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු.293,000,000.00ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇත. මෙය පහසුවෙන් හදුනා ගත හැකි | ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි නිවැරදිව දැක්වීමට කටයුතු කල යුතුය. |

වන පරිදි සටහනක් ලෙස ඉදිරි ප්‍රකාශනයන්හි සටහන් කරන බව දන්වමි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,846,298 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 11,933,946 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,912,352 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂ මෙහෙයුම් වියදම් රු.171,394,588 කින් වැඩි වීමට සාපේක්ෂව මුළු අදායම රු.179,306,940 කින් වැඩිවීම මෙම වර්ධනය හේතු වී තිබිණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තෙමින්තුවේ PED/12 චක්‍රලේඛයේ 9.12 වගන්තිය අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා නොගෙන අග්‍රහාර රක්ෂණ වාරිකයේ අර්ධයක වැය බර ලෙස රු.404,500 ක් අධිකාරිය විසින් වැය කිරීම. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්දේශ සහිත ලිපියක් රාජ්‍ය වයාපාර දෙපාර්තමේන්තුව වෙත 2021 වර්ෂයේදී යොමු කරන ලදී. | සුභසාධක යෝජනා ක්‍රම ආරම්භ කිරීමට පෙර අවශ්‍ය වන සියළුම අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විරුසරු කාඩ්පත් පිළියෙල කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් 2016 වර්ෂයේ ලැබී තිබුණු රු.16,607,826 ක මුදලින් රු.3,607,941 ක මුදලක් ඉතිරිවී ඇති අතර එම මුදල් උපයෝජනයකින් තොරව වසර 5 කට අධික කාලයක සිට පවතින බව නිරීක්ෂණය විය. | විරුසරු කාඩ්පත් නිකුත් කිරීමේ දෙවන අදියර සඳහා එම මුදල උපයෝජනය කරන බව දන්වා බව දන්වා ඇත. | නිශ්චිත අරමුණක් සඳහා ලැබී ඇති මුදල් කාර්යක්ෂමව එම අරමුණු සඳහා යොදා ගැනීමට කළමනාකාරීත්වය පියවර ගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) ඡේදයේ සඳහන් විධිවිධාන වලට පටහැනිව තරගකාරීබවකින් ප්‍රමානවත් පරිදි සැපයුම්කරුවන් ඉදිරිපත් වී නොමැති අවස්ථා 5 කදී තාක්ෂණික ඇගයීම සිදුකර තිබුණි. | සීමිත ජාතික තරගකාරී ලංසු කැඳවීම සිදු කිරීමට සැලසුම්කර තිබුනද රටතුළ නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම සහ අත්‍යාවශයයෙන්ම ආබාධිත උපකරන රණවිරුවන් වෙත ලබාදිය යුතු බැවින් සහ වර්ෂය අවසන් වීමට සීමිත කාලයක් ඇති බැවින් විද්‍යුත් තැපැල මගින් ලංසු කැඳවූ බව දන්වා ඇත. | ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුගත විය යුතුය. |
| (ආ) රු.2,510,000 ක් වටිනා Cochlear Implant replacement එකක් සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයන් බැහැරව එක් ආයතනයක් වෙතින් ලබාගත් ලංසුවක්, ශ්‍රවණාධාර උපකරණ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම සිදුකල තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත්කර ඇගයීම සිදුකර එම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට ඇතුලත් කර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීම විනිවිදභාවයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වේ. | ශ්‍රවණ උපකරණය සැපයීම සඳහා පවතින විශේෂිත එකම ආයතනය වන ජේ.එම්.වික්‍රමාරච්චි ආයතනයෙන් සෘජුවම ලංසු කැඳවා, මේ සඳහා පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අදාළ ශ්‍රවණ උපකරණය මිලදි ගත් බව දන්වමි. | ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුගත විය යුතුය. |
| (ඇ) ආබාධිත සහායක උපකරණ සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකල සෑම අවස්ථාවකදීම සීමිත ලංසුකැඳවීම යටතේ ලංසු ආරාධනා යොමු කිරීම සඳහා සැපයුම්කරුන් තෝරා ගැනීම විනිවිදභාවයකින් සිදුවී නොමැති අතර එක් අයිතමයක් සපයා ගැනීම වෙනුවෙන් අවස්ථා කිහිපයකදී ලංසු කැඳවීම සිදුකර තිබුණ අවස්ථාවන්ද විගණනයේදී නිරීක්ෂනය විය. ඒ අනුව අදාල නියමිත සැපයුම සැපයුම්කරුවන් වෙත ලංසු ආරාධනා යොමුකර නොමැති බවට අනාවරණය වේ. | රටටම අදාල වන පරිදි නිරෝධායන ඇඳිරි නීතිය පැනවීමක් ඇඳිරි නීත තත්ත්වයෙන් පසු සංචරණ සීමා පැනවීමක් නිසා සීමිත ජාතික තරගකාරි ක්‍රමයට ලංසු කැඳවීමට නොහැකි තතත්වයක් ඇති විය. මේ නිසා විද්‍යුත් තැපැල මගින් මිල ගණන් කැඳවන ලදී. ඇතැම් භාණ්ඩ සඳහා 2021 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති අවස්ථාවල 2020 වර්ෂයේ ලියාපංදිචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන ලයී. | ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුගත විය යුතුය. |